# රවුමක් යමු මාත් එක්ක



කතෘගේ නම :

දිල්රුකා චන්ද්‍රමෞලි ඇරෑගොඩ

කෘතියේ නම : රවුමක් යමු මාත් එක්ක

කතෘගේ නම : දිල්රුකා ඇරැගොඩ

කතෘ අයිතිය ඇතුළු විස්තර : ISBN no : 978-264-208-138-0

පිටකවර සිතුවම : ඩබ්.ඒ.සචිනි යෙතුම්සා වීරසිංහ

4- C ශ්‍රේණිය (ප්‍රාථමික අංශය)

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

පොත් පරිගණක සැකසුම : රුවින්දි කාව්‍යා තිලකරත්න

දෙවන වසර

මානවශාස්ත්‍ර පීඨය

කැලණිය විශ්වවිද්‍යාලය

කැලණිය

කතෘගේ වෙනත් කෘති : අපේ රෝස බක්කි කරත්තේ

මායා ගුරු ප්‍රණාමයට සුදු අරලිය මල් දෝතක්

කෘතිය පළ කරන දින : 2023/12/17

# පිදුම

අකුරු කියවා කලක් යන විට - පාට පාටින් රූප වින්දෙමි
“අම්මේ ලස්සන පොතක් ඕනෑ” - ළදැරියක කල ඇයට කීවෙමි
ගෙනා ඒ පොත රසින් පිරුණා - සොඳුරු **“රමයා”** පොතකි අගනා
අදත් සෙව්වට ලැබිය නොහෙනා - ඒ පොතින් සිත මිහිරි කෙරුණා

එදා සිට පොත් සමග වැඩුනෙමි - නේක රැළි මැද නොසෙල් වී එමි
මතුළ මුදු සිත තව ම රකිනෙමි - දරු නැණැස ඔබ සේම පාදමි
හරිම දේ නිවැරදි ව දකිමින් - සුහුරු මනසින් ලෝ දකින්නත්
සරු පෙදෙහි රස හව් විඳින්නත් - වෙසෙස් ගී රඟ සලරු විඳුමත්
හුරු කළේ ඔබ **මව්නි** කවදත්.....

සදය උපහාසයෙන් රසබර - පැවසූ සෑම දෙය වීය හරබර
ගැයූ ගී කිවි කතා සුන්දර - අද නැතත් අප ළඟින් නිරතුර
දෙව්ලොවේ ඔබ හටත් හරසර - පුදමි මා විඳි සොඳුරු පරිසර
තුළින් ලද වින්දන ද සිරිසර - මෙසේ පොත් පිංචකට ගොනුකර
**පියාණෙනි** හැම කල් සෙනේබර....

දෙගුරු දිවි මග නිතින් මනහර - අස්වැන්නකට වීය දියවර
දුටුවෙ එය මා නගා පියවර - නෙතින් නොව මනසින්ය හැමවර

නිබඳ ඔබ දෙපලගේ යහගුණ
බිඳක් **ලොවටම** පුදන්නෙමි මම

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන් ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන් ම කාලීන ජාතික අවශ්‍යතාවක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන් ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන් ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක් වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන් ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.01

අරුණු වලා හිමිදිරියට
රන්වන් පැහැ ගෙන දුන්විට
තුරුපත් මත සුදු පිනි කැට
දිලී සැලෙයි රටාවකට...





රාං රෑං මී මැස්සෝ
කීච් බීච් බට්ටිච්චෝ
ටිං ටිං තුන් ඉරි අප්පෝ
සැර ඊතල බත්කූරෝ

ලන්දේ බිම්මල් ගොල්ලේ
හැඩට වැඩට බැඳ ආලේ
පෙරලි පෙරලි එන තාලේ
දිලිහෙන කුරුමිණී බෝලේ



මකුලුහාමි හරි හරියට
රටා වියයි හැඩට වැඩට
පුදුමෙකි පැටලෙනු නැතුවට
හපනෙකි පුදුමෙකි ලෝකෙට



රඟනු ගයනු කැමැත්තෝ
කුරුලු කොබෙයි මලිත්තෝ
කොණ්ඩ කුරුලු බටිත්තෝ
බක බක ගෙඹි පොඩිත්තෝ



ජබොක් හඬින් පැන ජලේ
හැපී ඕලු පත් සැලේ
පීනති මාලුන් රැලේ
නිල් දිය පිරි විල්ජලේ

පිපුණු සුවඳ මල් ගාලේ
සිලි සිලි සමනල ලීලේ
අහිංසකයි හැම වේලේ
නංගි වගෙයි පොඩි කාලේ



සීත වලා සුදු සේලේ
සිරිපා වැඳුමට ලෝලේ
පේළි ගැසීගෙන සීලේ
සංවර වී යන තාලේ



කුහුඹු පේළි කඩිසරේ
කෑම සොයා පෙරහැරේ
යන සැටි දමමින් වෙරේ
හොඳ සිරිතක් හුරු කෙරේ

වැස්සට පෙර මේ ලෙසින්
කෑම සොයාගෙන තුටින්
කුසගිනි දුරලන අටින්
සමගි ව සූදානමෙන්



ඉත්තෑහාමි හොරෙන් හොරෙන්
අල හාරල හෙමින් හෙමින්
වෙහෙසී අල වැවූ අබරන්
සීයගෙ හිත හරි අවුලෙන්

කසන හීන් දළඹු රාල
නලියන පණු දිගටි රාල
ගොලුබෙලි හරි අලස ලීල
එක් ව හොරෙන් කති දලු පැළ



නිරන්තරේ සිරි විසිතුරු
වනන්තරේ රැඟු මොණරු
බියෙන් සැකෙන් තොර ව මිතුරු
වීම තමයි හරි අපූරු



රං රඹුටන් ගස් අස්සේ
වළිකුකුලන් එළි බැස්සේ
නිවාඩු කාලය තිස්සේ
සත්තු දකිමු අපි රිසිසේ

ඉදී පුසුඹ දෙන ඉතා
කජු අඹ පේර ද වෙතා
ඒ රසයට මත් වෙතා
සියලු සතුන් පැමිණෙතා



හොට දිගුකර ගස්ස ගස්ස
කිකිළියො ළං කරති හොස්ස
කුකුළු පැටව් එහි පසුපස
ඉව කර වී පිරුණු බිස්ස



ඇටිකුකුලන් දෙමලිච්චන්
පොල්කිච්චන් කලු කපුටන්
මඬේ ලගින කොරවක්කන්
හිනා ගෙනෙන කෝලිත්තන්

තියුණු දැස් ඇති උකුස්සා
උම්බෑ හඬ නගති වස්සා
පාට මාරු කල කටුස්සා
ගෙල පුම්බති වගේ පුස්සො



මී මැස්සෝ වද බඳී
ලොවට ම මී පැණි සැදී
මැස්සන් කුණු මත රැඳී
අපුල වේය ගඳ දිදී



මෙලෝ රහක් නෑ කියා
මී අඹ වුව හැරපියා
අගුපිල්වල කුණු සොයා
නිලමැස්සෝ මුව අයා

බේද නැතුව විසතුඩින්
හැමවිට ම විද රුදු ලෙසින්
කුස පුරවති රතු ලෙයින්
රෝග සදති මදුරුවන්



පොල්කටු විසිරී තිබුණම
කීටයො බෝවේ සැමතැන
ඩෙංගු රෝගයෙන් ගැලවුම
කළ යුතුමය සැම දෙනාම



නයි පොලඟුන් ඉතා විසයි
හිංසා කළවිටදි කිපෙයි
ගැරඬින් නම් අහිංසකයි
උපන් බැවින් ජීවත් වෙයි



මැක්කන් මකුණන් අනියි
කුඩැල්ලන් ලේ උරයි
පත්තෑ ගෝනුසු විසයි
වෙයන් සැම දේ නසයි

බිංකුන්ඩෝ නටවමු
කුරුම්බැට්ටි අහුලමු
හැංගිමුත්තො අල්ලමු
ඔංචිල්ලා පදවමු



අඳුරු වලා ගුලි ගැසේ
වැහි බිඳු එක දෙක ඉසේ
මඳ වැසි එන විට තොසේ
කඩදහි ඔරු හරි ගැසේ

වහලෙ පීල්ලේ දිගේ
වැහි දිය ඇල්ලක් වගේ
හිස අල්ලන ළමුන්ගේ
හිනාව උතුරන රඟේ



මී ගස් නිල් වනපෙතේ
සෙවන සදා ඵල දෙතේ
ඒ හා සම මෙදියතේ
යහගුණ වේ මනුසිතේ

කොස් දෙල් පොල් හැම අතේ
ගමේ සැවොම එක් වෙතේ
ගමම සමගි වී පුතේ
බෙදා ගනිති සැම වෙතේ



ලස්සන සාරියක් වගේ
සැඳෑ අහස හරිම අගේ
පාට පාට වලා ගඟේ
ඉරුත් මුහුදට යන රඟේ

පිපි පියුම් උදෑසනේ
විකසිතයි පුරා දිනේ
සේපාලිකා සමගිනේ
කුමුදු පිපෙයි ගොම්මනේ



බකුසුහාමි බුද්ධිමත්
දෙසවන් නම් හරි සමත්
දොඩමළු නැති විමසුමත්
හ්ම් හ්ම් මිස නෑ කිසිත්

තරු ද කණාමැදිරි එළි ද
කරවයි ගොම්මන තුරන්
රාත්‍රියට සිසිල සදන්
පුන්සඳ නැගුමට කලින්



මේ සැම රස විඳිමිනේ
සොඳුරු ගුණැති දරුවනේ
හුරු කර නිති යහගුණේ
සම්පත් වනු නිවහනේ



*දිල්රුකා චන්ද්‍රමෞලි ඇරැගොඩ*

*සහකාර විදුහල්පතිනිය*

*(ශ්‍රී.ලං.වි.සේ.01)*

*මහාමායා බාලිකා විද්‍යාලය*

*මහනුවර*

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක් ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන් ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් හා සැලසුම්කරුවන්ට මෙන් ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක් ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේව යි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01